# ඔලීණාට තෑග්ගක්



ඔනාදී තිසාමා නවරත්න

# ඔලීනාට තෑග්ගක්

ඔනාදි තිසාමා නවරත්න

# ඔලීනාට තෑග්ගක්

ඔනාදී තිසාමා නවරත්න

99B/2 උඩ ඊරියගම, පේරාදෙණිය.

**චිත්‍ර**

ඔනාදී තිසාමා නවරත්න

**ISBN 978-624-206-664-6**

## කතෘගේ වෙනත් කෘති

- ලොකුම වැරැද්ද
- ඔල්ගා ගේ සිහිනය
- අපූරු ගමන
- Mother Earth smiled at Olumalee
- Enchanted Present
- Little Olga's dream

**ප්‍රකාශක** - මහමායා බාලිකා විද්‍යාලය - මහනුවර

**කෘතිය එළිදක්වන දිනය** 2023-11-15

# පිදුම

ඔලීනාට තෑග්ගක් කතා පොත ලිවීමේ දී

මට උදව් කළ මගේ ආදර කුමාෂා අක්කාට ත්

චිත්‍ර ඇඳීමේ දී උදව් කළ සයෝන් අයියාට ත්

මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාව යි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයප්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

එකමත් එක ගමක ලස්සන පුංචි ගැහැණු ළමයෙක් හිටියා එයාගේ නම ඔලීනා. ඈ ඉතා ම යහපත් ගුණවත් සැමට ම උදව් උපකාර කරන දරුවෙකු ලෙස මිනිසුන් මෙන් ම සතුන් ද හොඳින් දැන සිටියා.



ඒ වගේ ම මිහිතලය පුරා සැරිසරන මහී සුරඟනගේ ආදරයත් ඔලීනාට ලැබුණා.



ඇය ගමේ සිටියත් ඇගේ පාසල තිබුණේ නගරයේ යි. තැන තැන විසි කර තිබෙන කෑම කන සතුන් ඇය නගරයේ දී නිතර ම දැක්කා. වාහන අතරින් දිවයන බලු පැටවුන් දැකපු ඔලීනාට ගොඩක් දුක හිතුණා.

ඉතිං ගමේත් නගරයේත් වෙනස හැමදාම පාසල් යද්දීත් එද්දීත් ඇයට පෙණුනා. මේ නිසා පුංචි ඔලීනාගේ හිතේ ලොකු බලාපොරොත්තුවක් ඇති වී තිබුණා.

ඒ තමයි දවසක සතුන්ටත් කුරුල්ලන්ටත් සතුටින් ඉන්න ලොකු උයනක් නිර්මාණය කරන එක.

දවසක් පුංචි ඔලීනාගේ පාසලේ තරගයක් සංවිධානය කරලා තිබ්බා.


" තම තමන්ගේ නිර්මාණ සඳහා ස්වභාවික දේවල් පමණක් යොදාගෙන්න" ගුරුතුමිය කිව්වා.

ඉතින් ඔලීනා නිර්මාණයට ඕනෑ දේවල් හොයන්න වත්තට ගියා.

නිල් කටරොළු මලකින් නිල් පාට මල් පෙතිත් අම්මාගේ රතු රෝස පඳුරෙන් රතු රෝස මල් පෙතිත් ඇයට ඕනෑ වුණා.

කරාබුනැටි ටිකකුත් සාදික්කා ගස යට වැටුණු රතු පාට වසාවාසිත් නිර්මාණයට යොදා ගන්නට ඕනි කියලා ඔලීනාට හිතුණා.

කොස් ගස යට දිරාගිය කොස් කොළත් හරිම ලස්සන යි.



කොළ එකතු කරමින් සිටි ඔලීනාට ටොමියා බුරන සද්දය ඇහුණා.

ටොමියා බිරුවේ වත්තේ තිබුණු ගල් තලාව පැත්තෙන්.

"ටොමියෝ බුරන්නෙ ඇයි? " ඔලීනා කෑගසා ඇසුවා.

"ටොමියා පුංචි සතෙකු අල්ලාගෙන වගෙයි" ඇයට කියවුණා.



“අනේ! පුංචි ලේන් පැටියෙක් නේද? හොඳ ටොමියනේ, අතාරින්න පුංචි පැටියාව” ඔලීනා ටොමියාට කිව්වා.

ටොමියා පුංචි ලේන් පැටියා අත ඇරලා වල්ගය සඟවාගෙන ලැජ්ජාවෙන් දිව්වා. ලේන් පැටියාව අතට ගත් ඔලීනා පැටියාගේ අම්මව සෙව්වා.




ඒත් එක්කම දුවගෙන ආපු ලේන් අම්මා ඔලීනා ළඟ නැවතුනා.

"ආ.... මෙන්න ලේන් අම්මෙ ඔයාගේ පුංචි පැටියාව" ඔලීනා පරිස්සමෙන් පුංචි ලේන් පැටියා ව බිමින් තිබ්බා.

ලේන් අම්මත් අත්දෙකින් ගුලිකරන් ආපු පුංචි කෙඳි බෝලයක් ඔලීනා ළඟින් තියලා පැටියත් අරන් කොස් ගහ උඩට ගියා.



“ ම්... මගේ නිර්මාණයට මේ සිනිඳු කෙඳි ටිකත් හොඳයි” ඔලීනා ලේන් අම්මාට ස්තුති කරමින් ඒ සිනිඳු කෙඳි ගුලියත් කූඩයට දමා ගෙන ගෙදර ගියා.



“දැන් මට ලස්සන කුරුල්ලෙක්ව නිර්මාණය කරන්න පුළුවනි” මල් පෙති, කරාබුනැටි, වසාවාසි, දිරාගිය කොස් කොළ හා සිනිඳු කෙඳි බෝලය මේසෙ උඩින් තැබූ ඔලීනාට සිතුණා.

ඇය ගම් බෝතලයත් ළඟට අරන් කුරුල්ලාගේ හිස කොටසට රතු හා නිල් මල් පෙති ඇලෙව්වා.

ඇස් කරාබු නැටිවලින් හැඩ කළා.

වසාවාසි වලින් රතු පැහැති පිහාටුත් දිරාගිය කොස් කොළවලින් දිග පිහාටුත් ඇලෙව්වා.

කුරුල්ලාගේ බඩට සිනිඳු කෙඳි ඇලවීමට ඇයට සිතුණා.



සිනිඳු කෙඳිබෝලය හෙමින් දිගහරිමින් කෙඳි වෙන් කරන්නට පටන් ගත් ඔලීනා ඒ තුළ වූ රන් පැහැති කෙඳි බෝලය දැක පුදුම වුණා.

"ඕ...ඇත්තම රත්තරන් කෙඳි වගේ" ඔලීනා ට හිතුනා. ඈ පුංචි රත්තරං කෙඳිබෝලය පරිස්සමෙන් දිග හැරියා.



හරි පුදුමයි. දේදුනු පැහැ ගත් දිලිසෙන මැණිකක් හරි ම ලස්සනට රත්තරන් කෙඳිවලින් ඔතා තිබුණා.

සෙමෙන් එය අතට ගත් ඇයට කුඩා ලිපියක් ද තබා තිබෙනු පෙණුනා.

"කැමති දෙයක් ප්‍රාර්ථනා කරන්න, එය ඔබට ලැබේවි. ඔබේ කරුණාවන්ත කමට මගෙන් තෑග්ගක්. මහී සුරඟන." එහි ලියා තිබුණා.



දිලිසෙන මැණික අතටගත් ඔලීනා ඇයගේ ලොකු ම බලාපොරොත්තුව ඉටුකර ගන්නට සිතුවා.

"සතුන්ට සතුටින් ජීවත් වෙන්න පුළුවන් ලස්සන උයනක් මට නිර්මාණය කරලා දෙන්න" ඔලීනා සතුටින් කිව්වා.

එදින පටන් ඔලීනාගේ ගෙවත්ත ලස්සන උයනක් බවට පත්වුණා. කුරුල්ලන්, සමනලයින්. ලේනුන් වැනි බොහෝ සතුන් උයනට ආවා. මලින් මලට පියාඹමින් ද දුව පැන සෙල්ලම් කරමින් ද ඔවුන් විනෝද වුණා.



ඕලීනාට ඇයගේ

බලාපොරොත්තුව ඉටුවීම නිසා

ගොඩක් සතුටු සිතුණා.



ඒ වගේ ම ඔලීනාට ස්වභාවික දේවලින් කළ හොඳ ම නිර්මාණයට ලැබෙන තෑග්ගත් ලැබුණා.



නිමි.



## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වැඩි ම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචානා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ පීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු . .

මෙයට
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
**2023 . 11 . 01**